# 2025.06.05 වන දින විශේෂ මහ සභා රැස්වීම් වාර්තාව

2025.06. 05 දින පෙරවරු 9.30 ට ගරු සභාපතිතුමාගේ ප්‍රධානත්වයෙන් මහ සභා රැස්වීමේ කටයුතු ආරම්භ කරන ලදී.

**ගරු සභාපතිතුමා :-**

**සුභ උදෑසනක් ප්‍රාර්ථනා කරනවා සියලුම දෙනාට. අද දින විශේෂ මහ සභාව සඳහා පැමිණි ගරු උප සභාපතිතුමිය ඇතුළු මන්ත්‍රීතුමන්ලා තුමියන්ලා සහ මාධ්‍යවේදීන්, ඒ වගේම ලේකම්තුමා ඇතුළු කාර්ය මණ්ඩලයත් ඉතාමත් ආදරයෙන් පිළිගනු ලබනවා.**

## පසුගිය වාර්තාව සම්මත කිරීම

නැත.

## විශේෂ නිවේදන

නැත.

## ලිපි සංදේශ ඉදිරිපත් කිරීම

නැත.

## කල් දී ඇති ප්‍රශ්න

නැත.

ගරු සභාපතිතුමා

මෙම විශේෂ මහසභාවේ කටයුතු කරගෙන යාමේදී සභා ගර්භය තුල ඇති තාක්ෂණික යෙදවුම් සම්බන්ධව සහ ඉදිරි කටයුතු පිළිබඳව පැහැදිලි කිරීම සඳහා සභාවේ ලේකම් මහතාට අවස්ථාව ලබාදීමට ගරු මහසභාව කාරක සභාවක් බවට පත්කරන ලෙස ඉල්ලා සිටිමි.

ගරු මන්ත්‍රී කේ.ඒ.පද්ම චන්ද්‍ර මහතා

ගරු මහසභාව කාරක සභාවක් බවට පත් කිරීම සුදුසු බවට යෝජනා කරමි.

ගරු මන්ත්‍රී කිව්. සිරිල් කීගල් මහතා

එම යෝජනාව මම ස්ථිර කරමි.

<u>ගරු මහසභාව කාරක සභාවක් බවට පත් කිරීම</u>

යෝජනාව - ගරු මන්ත්‍රී කේ.ඒ.පද්ම චන්ද්‍ර මහතා

ස්ථිර කිරීම - ගරු මන්ත්‍රී කිව්. සිරිල් කීගල් මහතා

<u>ගරු සභාපතිතුමා</u>

එම කටයුත්ත අවසන් නිසා සභාවේ කටයුතු කරගෙන යාම සඳහා කාරක සභාව මහසභාවක් බවට පත් කරන ලෙස ඉල්ලා සිටිමි.

<u>ගරු මන්ත්‍රී කේ.ඒ.පද්ම චන්ද්‍ර මහතා</u>

කාරක සභාව මහසභාවක් බවට පත් කිරීම සුදුසු බවට යෝජනා කරමි.

<u>ගරු උපසභාපති ජී.ඒ.චමිලා ප්‍රසාදිනී රත්නවර්ධන මිය</u>

එම යෝජනාව මම ස්ථිර කරමි.

<u>කාරක සභාව මහසභාවක් බවට පත් කිරීම</u>

යෝජනාව - ගරු මන්ත්‍රී කේ.ඒ.පද්ම චන්ද්‍ර මහතා

ස්ථිර කිරීම - ගරු උපසභාපති ජී.ඒ.චමිලා ප්‍රසාදිනී රත්නවර්ධන මිය

## <u>යෝජනා</u>

## <u>යෝජනා අංක :- 01</u>

**<u>ගරු සභාපති එල්.පී.ජගත් ගුණතිලක මහතා විසින් ඉදිරිපත් කරන ලද.</u>**

**කුරුණෑගල ප්‍රාදේශීය සභාවේ 07 වන සැසි වාරයේ , 2025 වර්ෂය තුල සභාව කැඳවිය යුතු දින හා වේලාවන් පහත සඳහන් පරිදි සුදුසු බවට ගරු විශේෂ මහසභාවට යෝජනා කරන්නීය.**

| අනු අංකය | මාසය | දිනය | වේලාව |
|---|---|---|---|
| 1 | ජුනි | 17 | පෙ.ව.09.30 |
| 2 | ජුලි | 17 | පෙ.ව.09.30 |
| 3 | අගෝස්තු | 14 | පෙ.ව.09.30 |
| 4 | සැප්තැම්බර් | 11 | පෙ.ව.09.30 |
| 5 | ඔක්තෝම්බර් | 16 | පෙ.ව.09.30 |
| 6 | නොවැම්බර් | 13 | පෙ.ව.09.30 |
| 7 | දෙසැම්බර් | 11 | පෙ.ව.09.30 |

ගරු උපසභාපති ජී.ඒ.චමිලා ප්‍රසාදිනී රත්නවර්ධන මිය

**කුරුණෑගල ප්‍රාදේශීය සභාවේ 07 වන සැසි වාරයේ , 2025 වර්ෂය තුල සභාව කැඳවිය යුතු දින හා වේලාවන් සම්බන්ධව ගරු සභාපතිතුමා ගෙනෙන්නට යෙදුන එම යෝජනාව මම ස්ථිර කරමි.**

තීරණ අංක ÷ 01

කුරුණෑගල ප්‍රාදේශීය සභාවේ 07 වන සැසි වාරයේ , 2025 වර්ෂය තුල සභාව කැඳවිය යුතු දින හා වේලාවන් පහත සඳහන් පරිදි සුදුසු බවට ගරු සභාපති එල්.පී.ජගත් ගුණතිලක මහතා විසින් ඉදිරිපත් කර තිබූ යෝජනාව ගරු විශේෂ මහසභාව විසින් සලකා බැලීමෙන් අනතුරුව, කුරුණෑගල ප්‍රාදේශීය සභාවේ 07 වන සැසි වාරයේ 2025 වර්ෂය තුල සභාව කැඳවිය යුතු දින හා වේලාවන් පහත සඳහන් පරිදි සුදුසු බවට ගරු විශේෂ මහ සභාව විසින් ඒකමතිකව තීරණය කරන ලදී.

| අනු අංකය | මාසය | දිනය | වේලාව |
|---|---|---|---|
| 1 | ජුනි | 17 | පෙ.ව.09.30 |
| 2 | ජුලි | 17 | පෙ.ව.09.30 |
| 3 | අගෝස්තු | 14 | පෙ.ව.09.30 |
| 4 | සැප්තැම්බර් | 11 | පෙ.ව.09.30 |
| 5 | ඔක්තෝම්බර් | 16 | පෙ.ව.09.30 |
| 6 | නොවැම්බර් | 13 | පෙ.ව.09.30 |
| 7 | දෙසැම්බර් | 11 | පෙ.ව.09.30 |

යෝජනාව :- ගරු සභාපති එල්.පී.ජගත් ගුණතිලක මහතා

ස්ථිර :- ගරු උප සභාපති ජී.ඒ.චමිලා ප්‍රසාදිනී රත්නවර්ධන මිය

ගරු සභාපතිතුමා :-

එහෙම නම් අද දවසට නියමිත සභාවේ වැඩ කටයුතු මෙතකින් නිමාවට පත් වෙනවා. අද දින රැස්වීමට සහභාගී වූ ගරු මන්ත්‍රී මණ්ඩලයේ සියලුම දෙනාටත්, මාධ්‍යවේදී මහත්ම මහත්මීන්ටත් මගේ ස්තූතිය පුද කරනවා. මේ ගරු මන්ත්‍රීතුමන්ලාගේ,තුමියන්ලාගේ දැනුම අවබෝධය සහ අත්දැකීම් උපයෝගී කරගනිමින් අප කුරුණෑගල ප්‍රාදේශීය සභා බලප්‍රදේශය තුලින් මේ රට ලෝකයේ තිබෙන අභිමානවත්ම රට බවට පත් කිරීමට ශක්තිය ලබාදීම සඳහා ඔබ සැමට ආරාධනා කරමින් විශේෂ මහ සභා රැස්වීමේ කටයුතු අවසන් කරනවා

මහ සභා රැස්වීමේ කටයුතු පෙරවරු 10.00 අවසන් කරන ලදී.

..............................

**සභාපති,**

**කුරුණෑගල ප්‍රාදේශීය සභාව**